**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**
**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

**<u>ඉන්දීය හමුදා ආදි පුහුණුලාභීන්ගේ වැඩසටහනක්</u>**

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලද ඉන්දීය හමුදා ආදි පුහුණුලාභීන්ගේ වැඩසටහනක් 2022 ඔක්තෝබර් 4 වන දින පැවැත්විණ. ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍රා සිල්වා මහතා සහ ශ්‍රී ලංකා හමුදාපති ලුතිනන් ජෙනරාල් විකුම් ලියනගේ මහතා ඇතුළු ඉන්දීය හමුදා පුහුණු ආයතනයන්හි පුහුණුව ලැබූ දැනට ශ්‍රී ලංකා හමුදා සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ සහ විශ්‍රාමික නිලධාරීහු රැසක් මේ සඳහා සහභාගී වූහ. දෙරට හමුදාවන් අතර පවතින සහයෝගීතාවයේ, සහෝදරත්වයේ සහ මිත්‍ර ත්වයේ දිගුකාලීන බැඳීම් සමරමින් මෙම වැඩසටහන පැවැත්විණ.

2. මෙම අවස්ථාවේ අදහස් දක්වමින් මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා ඉන්දියාව සිය "අසල්වැසියා ප්‍රථමයෙන්" යන ප්‍රතිපත්තියට අනුකූලව ධාරිතා සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාවට සහය වීමට කැප වී සිටින බව ප්‍රකාශ කළේය. අභියෝගාත්මක කාලයන් හිදි පවා ඉන්දියාව ශ්‍රී ලංකා හමුදාවන්ට පුහුණුවීම් ලබා දුන් බව එතුමා සිහිපත් කළේය. හමුදාවන් අතර පුහුණු වැඩසටහන් සහෝදරත්වයක් සහ සේවාවන් ඉටු කිරීමේදී මනා සුසංයෝගයක් ඇති කර තිබෙන බව ද එතුමා සඳහන් කළේය. එසේම, මෙවන් අන්තර් ක්‍රියාවන් ශ්‍රී ලංකාවේ ආදි ඉන්දීය හමුදා පුහුණුලාභීන්ගේ සංගමය සමඟ ශක්තිමත් සබඳතා ඇති කිරීමට ඉවහල් වන බව ද එතුමා පැවසීය.

3. ආරක්ෂක ලේකම්තුමා මෙහිදී දෙරට මිත්‍රශීලී, අන්‍යෝන්‍ය වශයෙන් ගරු කරන සහ එකිනෙකා පිළිබඳ සැලකිල්ලක් දක්වන අසල්වැසි රාජ්‍යයන් දෙකක් වශයෙන් සම්බන්ධ කිරීමට මහ කොමසාරිස්තුමා ගන්නා ප්‍රයත්නයන් අගය කළේය. ඉන්දියාව සැමවිටම ශ්‍රී ලංකා හමුදාවන් පුහුණු කිරීමෙහි ලා ශ්‍රීය

ලංකාවට ශක්තියක් වී ඇති බව ද මිත්‍රශීලී අසල්වැසියන් ලෙස ඉන්දියාව සහ ශ්‍රීය ලංකාව අතර ශක්තිමත් සංස්කෘතික, ජන විකාසන සහ චර්යාමය සමානතා පවතින බව ද එතුමා සඳහන් කළේය. එසේම එතුමා ඉන්දියාව විසින් ලබා දෙන සියලු පහසුකම්වලින් සමන්විත, විස්තීර්ණ පුහුණු අවස්ථාවන් සඳහා කෘතවේදීත්වය පළ කළේය.

4. ඉන්දියාව සහ ශ්‍රීම ලංකාව අතර ද්විපාර්ශවික ආරක්ෂක සහයෝගීතාවයේ ශක්තිමත් ම සහ දිගු කාලීන ම කුළුණ පුහුණුවීම් වේ. ඉන්දීය ආරක්ෂක හමුදා පුහුණු ආයතන විසින් වාර්ෂිකව ශ්‍රී ලංකාවට පුහුණු අවස්ථාවන් 1500කට ආසන්න ප්‍රතමාණයක් පිරිනමන අතර එය ඉන්දියාව විසින් රටකට පිරිනමන විශාලතම වාර්ෂික පුහුණු අවස්ථා ප්‍ර මාණය වේ. ඉන්දීය රජයේ විශේෂ ආධාර වැඩසටහන යටතේ මෙම පුහුණුලාභීන්ට සහයෝගය ලබා දේ. ඉන්දියාව තුළ ශ්‍රීට ලංකා හමුදා සාමාජිකයන්ට ලබා දෙන ගුණාත්මක තත්වයෙන් ඉහළ පුහුණු වීම් මෙහෙයුම් සඳහා සූදානම් සහ එකට එක්වූ ශ්‍රීත ලංකා හමුදාවන් ගොඩ නැඟීමට බෙහෙවින් දායක වී ඇත.

***

කොළඹ
2022 ඔක්තෝබර් 7